# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඒ.ඒ.පී. ඩිල්රුක්ෂි ඩයස්
වික්‍රමසිංහ
අංක 377/02
තලවතුගොඩ පාර
හෝකන්දර

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/181/2023**

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලය
අංක 1200/09
රජමල්වත්ත පාර
බත්තරමුල්ල

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී :**

1. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
4. ඒ.එම්. නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ නීතිඥ දුල්මි ද අල්විස් මිය සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් නම් කළ නිලධාරි / අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) තනූජා මුරුගේෂන් මිය සහ තොරතුරු නිලධාරි / ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විනය) එස්.එච්. පරණවිතාන මිය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - 2023.06.15

**විභාග කළ දිනය :** 2023.06.21, 2023.08.24, 2023.11.15, 2024.01.04

**තීරණය කළ දිනය :** 2024.01.04

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2022.11.08 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

1. *රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/DIS/053/2019 සියලුම ගොනු අධීක්ෂණය කිරීම*
2. *රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/DIS/053/2019-(CA Writ) ගොනුව අධීක්ෂණය කිරීම.*
   *(තොරතුරුවලට අදාළ කාල පරිච්ඡේදය-2019 සහ 2021 වර්ෂ)*

තොරතුරු නිලධාරී විසින් 2022.11.17 දිනැතිව එකී තොරතුරු ඉල්ලීම ලද බවට දන්වා ඇති අතර 2022.12.08 දිනැතිව පහත පරිදි තම ප්‍රතිචාරය දක්වා ඇත. ඒ අනුව,

*'ඔබ විසින් 2022.11.08 දිනැතිව ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක PSC/DIS/RTI/155 දරන තොරතුරු ඉල්ලීම, පනතේ 5 වන උප වගන්තියේ පහත සඳහන් කර ඇති හේතුව මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි. කෙසේ වුවද, අංක PSC/DIS/053/2019 හා අංක PSC/DIS/053/2019 (CA Writ) දරන ගොනු තුළ ඔබට ලබා ගැනීමට අවශ්‍ය ලිපි පවතී නම්, ඒ පිළිබඳව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.*

1. *එම ලිපියෙන් ඉල්ලා ඇති අංක PSC/DIS/053/2019 හා අංක PSC/DIS/053/2019 (CA Writ) දරන ගොනු තුළ මෙතෙක් අවසන් නොවූ විනය ක්‍රියාමාර්ගයකට අදාළ තොරතුරු ඇතුලත් වන බැවින්, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) (ඌ) (i) උපවගන්තිය අනුව එම ගොනු අධීක්ෂණය කිරීම සඳහා ලබා දීමට නොහැකි වීම.'*

තොරතුරු නිලධාරිගේ එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2022.12.27 දිනැතිව පොදු අධිකාරියේ නම් කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම් කළ නිළධාරි විසින් 2022.12.29 දිනැති ලිපියකින් පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*'අභියාචකගේ අභියාචනයෙන් අපේක්ෂිත තොරතුරු සම්බන්ධයෙන් තොරතුරු නිලධාරී විමසන ලදුව ඒ පිළිබඳ තොරතුරු නිලධාරී විසින් පහත නිරීක්ෂණ මා වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත.*

| | *අපේක්ෂිත තොරතුරු* | *නිරීක්ෂණ* |
|---|---|---|
| 01 | *අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MOJ/E08/පොදු (ii) හා 2019.09.23 දිනැති ලිපිය* | *මෙම ලිපිය ලබාදීම සඳහා අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් එකඟතාව ලබා දී නොමැත.* |
| | *නීතිපතිගේ අංක CF/24/2019 හා 2019.09.23 දිනැති ලිපිය* | *අංක: PSC/DIS/RTI/2020-I හා 2022.01.18 දිනැති ලිපියෙන් ඔබ වෙත ලබා දී ඇත.* |
| 02 | *අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MOJ/E08/පොදු (ii) හා 2019.09.30 සහ 2019.10.14 දිනැති ලිපි* | *මෙම ලිපි ලබාදීම සඳහා අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් එකඟතාවය ලබා දී නොමැත* |

| | | |
|---|---|---|
| | *නීතිපතිගේ අංක ASG (Admin)/76 හා 2019.10.09 දිනැති ලිපිය* | *අංක: PSC/DIS/RTI/2020-I හා 2022.01.18 දිනැති ලිපියෙන් ඔබ වෙත ලබා දී ඇත.*<br><br>*සටහන - අංක : PSC/DIS/053/2019 හා 2019.10.18 දිනැති ලිපියේ, 2019.10.09 දිනැති ලිපිය ප්‍රමාද දෝෂයකින් අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියක් ලෙස සඳහන් කර ඇතත්, එම 2019.10.09 දිනැති ලිපිය නීතිපතිගේ ලිපියක් බව වැඩිදුරටත් සඳහන් කරමි.* |
| 03 | *අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MOJ/E08/AGD/DIS හා 2020.10.12 දිනැති ලිපිය* | *මෙම ලිපිය ලබාදීම සඳහා අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් එකඟතාවය ලබා දී නොමැත.* |

නම් කළ නිලධාරිගේ උක්ත ප්‍රතිචාරයෙන්ද අතෘප්තියට පත් අභියාචක විසින් 2023.02.25 දිනැතිව මෙම කොමිෂන් වෙත අභියාචනයක් යොමු කර ඇත.

2023.06.06 දිනැති කාර්යාලීය කාර්ය සටහන් අංක 2 අනුව දෙපාර්ශවය වෙතම විද්‍යුත් තැපැල් මගින් නොතීසි නිකුත් කර ඇත.

එකී නොතීසියෙන් පසුව පොදු අධිකාරියේ නම් කළ නිලධාරි, අතිරේක ලේකම් (මෙහෙයුම්) විසින් 2023.06.15 දිනැති ආවරණ ලිපියක් මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අමතමින් ඊට අදාළ ඇමුණුම්ද සහිතව එවා ඇති අතර එහි පහත පරිදි දැක්වේ.

| | *ඒ.ඒ.පී.ඩී. ඩයස් වික්‍රමසිංහ මහත්මිය විසින් තොරතුරු නිලධාරී වෙත යොමු කර ඇති ලියාපදිංචි අංක PSC/DIS/RTI/96 ට අදාළ ඉල්ලීම් ලිපිවල දින* | *තොරතුරු නිලධාරී විසින් පිළිතුරු ලිපි යොමු කරන ලද දින* | *PSC/DIC/RTI/96 ට අදාළව නම් කල නිලධාරී වෙත යොමු කර ඇති අභියාචන වල ලියාපදිංචි අංක* | *නම්කළ නිලධාරී විසින් පිළිතුරු ඉදිරිපත් කර ඇති දින* |
|---|---|---|---|---|
| *(I)* | *2021.08.09 (ඇමුණුම I)* | *2021.10.11 (ඇමුණුම II)* | *117 (ඇමුණුම IV)* | *2021.12.16 (ඇමුණුම V)* |
| | | *2022.01.18 (ඇමුණුම III)* | | |
| *(II)* | *2022.02.10 (ඇමුණුම VI)* | *2022.02.17 (ඇමුණුම VII)* | | |
| | | *2022.10.28 (ඇමුණුම VIII)* | | |
| | | *2022.11.16 (ඇමුණුම IX)* | *155 (ඇමුණුම X)* | *2022.12.29 (ඇමුණුම XI)* |

*....... 03. වික්‍රමසිංහ මහත්මිය විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ නම් කළ නිලධාරි වෙත 2022.11.28 දිනැතිව අභියාචනයක් (RTI 10) ඉදිරිපත් කරමින්, අනු අංක 1, 2 සහ 6 යටතේ අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ හා ගරු නීතිපතිගේ ලිපි*

*කිහිපයක් ඉල්ලා ඇත. එමගින් ඉල්ලා සිටින ලද ගරු නීතිපතිගේ ලිපි, ඒ වන විටත් තොරතුරු නිලධාරි විසින් ලබා දී තිබූ බැවින් ඒ පිළිබඳවත්, අධිකරණ අමාත්‍යංශ ලේකම්ගේ ලිපි ඇය වෙත ලබා දීම සඳහා එම ලේකම් විසින් සිය එකඟතාවය ලබා දී නොමැති බවත්, මගේ අංක PSC/OPR/RTI/05/2022 හා 2022.12.29 දිනැති ලිපියෙන් අභියාචක වෙත දන්වා යවන ලද බව......*

*04. .........තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අභියාචක විසින් ඉල්ලුම් කරන ලද, අධිකරණ අමාත්‍යංශ ලේකම් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපි, නොනිමි විනය කරුණකට අදාළව මෙම පොදු අධිකාරියේ පවත්වාගෙන යන ගොනුවකට යොමු කරන ලද ලිපි බැවින්, ඇය වෙත ලබා දීම සම්බන්ධයෙන් එම අමාත්‍යංශ ලේකම් වෙතින් පනතේ අංක 29 (1) වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව එකඟතාවය විමසා ඇත......*

*05. කෙසේ වුවද, අධිකරණ අමාත්‍යංශ ලේකම් විසින් එම ලිපි අභියාචක වෙත ලබා දීම සඳහා සිය එකඟතාවය ලබා දී නොමැති බැවින්, පනතේ 5 (1) (එ) වගන්තිය යටතේ ඇයට එම තොරතුරු ලබා දී නොමැත......*

*06. ....... අභියාචක විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම (RTI 01) සඳහා උක්ත පනතේ සම්පාදිත විධිවිධානයන්ට යටත්ව තොරතුරු නිලධාරි විසින් අභියාචක වෙත හෙළිදරව් කර ඇති බව නිරීක්ෂණය වන බව කාරුණිකව දන්වමි. ඒ අනුව නම් කළ නිලධාරි විසින් ඒ බැව් අභියාචක වෙත දන්වා ඇති බවද.......”*

**සළකා බැලීම**

අභියාචකගේ 2022.11.08 දින දරණ තොරතුරු ඉල්ලීම මගින් ඉල්ලා ඇති තොරතුරු වන අදාළ ලිපි ගොනු පරීක්ෂා කිරීම සම්බන්ධව පොදු අධිකාරියේ ස්ථාවරය කොමිෂන් සභාව ඉදිරියේ දක්වමින් පොදු අධිකාරිය වෙනුවෙන් සහභාගි වූ නම් කළ නිලධාරි, අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය) තනුජා මුරුගේෂන් මහත්මිය සහ එහි තොරතුරු නිලධාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විනය) එස්.එච් පරණවිතාන මහත්මිය කොමිෂන් සභාවට දන්වා සිටිනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා සාමාජිකයන් විසින් සිය අත් අකුරින් තබන ලද සටහන් හැර අනෙකුත් තොරතුරු අභියාචක වෙත පරීක්ෂා කිරීමට අවස්ථාව ලබා දීමට තමන් එකඟ බවය.

පොදු අධිකාරිය විසින් යෝජනා කරන ලද සීමාවන්ට යටත්ව අදාළ ලිපි ගොනු පරීක්ෂා කිරීමට අභියාචක තම එකඟතාවය පල කරන ලදී.

ඒ අනුව 2024.02.01 වන දින ප.ව 12.00 න් පසුව කාර්යාලීය වේලාව තුළ අභියාචකට සහ ඇයගේ නීතිඥ හට පොදු අධිකාරියේ කාර්යාලය තුළදී එම ලිපි ගොනු ඉහත කී කොන්දේසි වලට යටත්ව පරීක්ෂා කිරීමට ඉඩ ලබා දීමේ එකඟතාවය මත මෙම අභියාචනය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

එසේම, “2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)” රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.